මැදිකාලීන ගෙවුම් ශේෂ ආධාර ලබාදීමට පිහිටුවා ඇති "පුළුල් කරන ලද අරමුදල් පහසුකම" යටතේ ආධාර ලබා ගැනීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සාර්ථක සාකච්ඡාවක් 1978 දී පැවැත්විය. 1979 මුලදී එම ආධාර වැඩපිළිවෙල අනුමත කිරීමෙන් පසු. 1979 – 81 දක්වා කාලපරිච්ඡේදය සඳහා වි.හැ.අ. දශලක්ෂ 260·3 ක් (රුපියල් දශලක්ෂ 5,206) දක්වා ශ්‍රී ලංකාවට ණය ගැනීමට හැකිවේයයි බලාපොරොත්තු වේ. සාමාන්‍යයෙන් මෙම ණය ගැනීම් ණය ගත් දින සිට අවුරුදු 4—8 දක්වා කාලයක් තුළ සමාන වාරික 16 කින් ආපසු ගෙවා නිම කළ යුතුවේ. මෙම ණයවලින්, අවුරුද්දකට අඩු කාලයක් තුල නොගෙවා ඉතිරිව ඇති ණය සඳහා වර්ෂයකට සියයට 4·375 ක ගාස්තුවක් අය කරන අතර ඉන්පසු සෑම වර්ෂයක් සඳහාම එම අනුපාතිකය සියයට 0·5 බැගින් සියයට 6 875 දක්වා වැඩිවේ. ආපසු නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය ප්‍රමාණය 1977 දී රුපියල් දශලක්ෂ 13,221 සිට (වි.හැ.අ. දශලක්ෂ 705) 1978 දී රුපියල් දශලක්ෂ 16,446 (වි හැ.අ. දශලක්ෂ 813) දක්වා වැඩි විය. මෙම වැඩිවීමට හේතු වූයේ යෝජනා ක්‍රම හා භාණ්ඩ ආධාරවලින් ප්‍රධාන වශයෙන් සමන්විත දිගුකාලීන ණය වැඩිවීමය. ආපසු නොගෙවා ඉතිරිව ඇති දිගු කාලීන ණය මට්ටම 1977 දී රුපියල් දශලක්ෂ 10,594 (වි.හැ.අ. දශලක්ෂ 561) සිට 1978 දී රුපියල් දශලක්ෂ 13,803 (වි හැ.අ. දශලක්ෂ 682) දක්වා වැඩි විය. කෙටිකාලීන ණය මත ඇති රැඳියාව අඩුවීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශීය ණය ව්‍යුහයෙහි විදේශීය ණයවල වැදගත්කම 1978 දී තවදුරටත් වැඩි විය.

එක්සත් ජනපද ඩොලරය හැර අනෙක් ප්‍රධාන මුදල්වලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලේ අගය 1978 දී පහත වැටුනි. 1977 නොවැම්බර් මාසයේ සිට ශ්‍රී ලංකා රුපියලේ අගය රන් පවුම, ජපන් යෙන්, ජර්මන් මාර්ක් සහ වි.හැ.අ. වලට ප්‍රතිමුඛව පිළිවෙලින් සියයට 8·3, සියයට 18·8, සියයට 16·9 සහ සියයට 6·3 වශයෙන් විය. එසේ වුවද, එක්සත් ජනපද ඩොලරය සමඟ සසඳන විට ශ්‍රී ලංකා රුපියලේ අගය සියයට 3·2 කින් වැඩි විය.

## රජයේ මුදල් පරිහරණය

1977 නොවැම්බර් මස හඳුන්වා දුන් ආර්ථික සංශෝධන 1978 රාජ්‍ය මූල්‍ය ක්‍රියාවලියේ මට්ටම සහ නැඹුරුවූ දිශාව හැඩ ගැස්වීමෙහි ලා තියුණු බලපෑමක් ඇති කළ බැව් පැහැදිලිව දැක්විය හැකිය. මිළෙහි වෙනස්කම්, බදු පදනම පුළුල් කිරීම, බදු අනුපාතිකයන්හි ගැළපීම් සහ වියදම් ඉහළ යෑම අයවැය ලේඛණයේ ප්‍රමාණය දෙගුණ කිරීමට හේතු විය. දිශාව ගැන සඳහන් කරන විට, රජයේ වියදම පාරිභෝජනයේ සිට ආයෝජනය කෙරේ යොමු කිරීම සඳහා ව්‍යුහාත්මක වශයෙන් ගත් පැහැදිලි පරිශ්‍රමයක් දක් වේ. 1977 සංශෝධන කටයුතුවල විශාලත්වය හේතු කොට ගෙන ඇතිවූ වෙනස්කම් නිසා, 1978 අයවැය ලේඛණයේ අවසාන ප්‍රතිඵලය දැන ගැනීම අපහසු කාර්‍යයක් විය. අවසානයේදී ජංගම ගිණුමේ රුපියල් දශ ලක්ෂ 701 ක හිඟයක් පෙන්වීය.

1978 දී රුපියල් දශ ලක්ෂ 173 ක නාමික ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කළ බව රජයේ ගිණුම් පිළිබඳ දත්තයන් පෙන්වයි. එහෙත් වර්ෂය අවසානයේ කළ සමහර මූල්‍ය සංක්‍රාමයන් හිලව් කිරීම උදෙසා ගැළපුම් කළ විට සහ නිෂ්කාශණය නොවී තිබූ අධික චෙක්පත් සංඛ්‍යාව සැලකිල්ලට ගත් විට රුපියල් දශ ලක්ෂ 893 ක පමණ සංකෝචනාත්මක බලපෑමක් අය වැය කටයුතු මගින් ඇතිවුණු බව පෙනේ.[1]

1977 වසරේ රුපියල් දශ ලක්ෂ 9,760 ක් ව පැවැති රජයේ මුළු වියදම 1978 රුපියල් දශ ලක්ෂ 18 939 දක්වා හෙවත් සියයට 94 කින් ඉහළ ගියේය. පුනරාවර්තන වියදම රුපියල් දශ ලක්ෂ 10,408 ක් විය. එය දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත් විට 1977 දී සියයට 23 සිට 1978 දී සියයට 34 දක්වා ඉහළ යෑමක් පෙන්නුම්

1. ජාතික සංවර්ධන බැංකුවට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කළ රුපියල් දශ ලක්ෂ 390 ක නාමික සංක්‍රාමය වෙනුවෙන් සහ වසර අවසානයේ නිශ්කාෂණය නොවූ රුපියල් දශ ලක්ෂ 666 ක චෙක්පත් වෙනුවෙන් දත්ත ගලපා ඇත.

කරයි. ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 5,441 කි. දළ ජාතික නිෂ්පාදිතයට අනුපාතිය වශයෙන් ප්‍රාග්ධන වියදම සියයට 12 සිට 1977 දී සියයට 8 දක්වා පහත වැටුනු අතර, 1978 සියයට 15 ක් දක්වා තියුණු ලෙස ඉහළ ගිය බැව් පෙනේ. භාණ්ඩාගාර තැන්පතු සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත කෙරුණු සමහර වසරාවසාන මූල්‍ය සංක්‍රාමයන් ඉවත් කළ විට ප්‍රාග්ධන වියදම් අනුපාතය සියයට 13 දක්වා පහත වැටේ. කෙසේ නමුත් එය පසුගිය වසරට වඩා ඉහළ මට්ටමක් බැව් පෙනේ.

1978 ආදායම රුපියල් දශ ලක්ෂ 11,633 වූ අතර පසුගිය වසරට වඩා සියයට 74 ක වැඩි වීමකි. එය දළ ජාතික නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් 1977 සියයට 23 සිට 1978 සියයට 32 දක්වා ඉහළ යෑමක් පෙන්නුම් කරයි.

1978 අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 7,307 ක් වූ අතර එය මුළු වැයෙන් සියයට 39 කි. මෙය පසුගිය වසරේ මුලු වියදම හා සලකන විට සියයට 31 පමණක් වූ රුපියල් දශ ලක්ෂ 3,074 ක හිඟයට වඩා සැලකිය යුතු වැඩිවීමකි. 1978 පුනරාවර්තන වියදම සහ ආදායමේ වැඩිවීම පුළුල් වශයෙන් සමාන වූ බැව් පෙනේ. අනෙක් අතට, ප්‍රාග්ධන වියදමේ ඉහළ වර්ධන අනුපාතයක් පෙන්වයි. 1978 හිඟය වැඩි කිරීමට මෙය ද හේතු විය.

1978 වසරේ රාජ්‍ය මූල්‍ය කටයුතුවල සාරාංශයක් සහ 1979 සඳහා අනුදත් ඇස්තමේන්තු 1·14 දරන සංඛ්‍යා සටහනෙහි සඳහන් වේ. 1978 රජයේ මූල්‍ය ක්‍රියාවලියේ ප්‍රතිඵලයක් වශයෙන් පැන නැගි, ශුද්ධ මූල්‍ය හිඟය සහ පසුගිය දෙළොස් වසර සඳහා සංසන්දනාත්මක දත්ත පරිශිෂ්ඨයේ 9 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**ආදායම**

1978 රජයේ ආදායම, තාවකාලික දත්තයන් අනුව රුපියල් දශ ලක්ෂ 11,633 ක් වූ අතර 1977 ට වඩා සියයට 74 ක වැඩි වීමක් පිළිබිඹු කරයි. 1978 දී ඇතිවුන ආර්ථික පුනර්ජීවනය ද 1977 නොවැම්බර් මාසයේ වූ ආර්ථික ප්‍රතිපත්ති සංශෝධන නිසා අවශ්‍ය වූ ගැලපුම් ද මෙම වැඩි වීමට සාධක විය. 1977 සංශෝධනයන් අතර, අපනයන බදු, ආනයන බදු සහ ව්‍යාපාර පිරිවැටුම් බදු ව්‍යුහයන්ගේ සංශෝධනයන් හා ආදායම් බදු ප්‍රතිශෝධනයන් ද විය. රුපියල අවප්‍රමාණ කිරීමෙන් ලැබූ වාසි ඉවත් කිරීම සඳහා තේ, රබර් හා පොල් කෙරේවූ අපනයන බද සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ නංවන ලදී. ආනයන බදු අනුපාතික පහත හෙලූ මුත් විනිමය අනුපාතික ඒකීයකරනය නිසා බදු පදනම ප්‍රසාරනය වූ අතර, ආනයන ප්‍රතිපත්ති ලිහිල් කිරිමෙන් ආනයන පරිමාව වැඩි විය. කිහිපයක් හැර, අනුපාතික කාණ්ඩ ගණන දහයේ සිට තුන දක්වා අඩු කරමින් ව්‍යාපාර පිරිවැටුම් බදු ව්‍යුහයේ ද වෙනසක් ඇති කෙරිනි.

අපනයන බදු ආදායම අට ගුණයකින් පමණ වැඩි වූ අතර එය වර්ෂයේ මුළු ආදායමෙන් සියයට 30 කට දායක විය. 1978 දී අපනයන සියයට 4 කින් පමණක් වැඩි වී තිබිය දී ආදායමේ තියුණු වැඩි වීමට උදක්ම හේතු වූයේ, විනිමය අනුපාතික සංශෝධනයෙන් ඇතිවූ බදු අනුපාතික වැඩි කිරීම හා බදු පදනම පුළුල් වීමයි. ආනයන බදු වලින් වූ ලැබීම් තෙගුණ වී ඇත. මෙයට හේතු වශයෙන් විනිමය අනුපාතිකය වෙනස් වීම සහ ආනයන ප්‍රමාණය සියයට 30 කින් වැඩි වීම දැක්විය හැකිය. පසුගිය වර්ෂයේ සුළු වශයෙන් පහත වැටුනු පිරිවැටුම් බදු ආදායම මෙම වර්ෂයේ සැලකිය යුතු ප්‍රමාණයකින් එනම් සියයට 62 කින් වැඩිවිය. මෙයට හේතු වූයේ බදු අනුපාත වල අඩු කිරීම සමහන් කරමින් ව්‍යාපාර සහ නිෂ්පාදන අංශවල වැඩිවුනු ක්‍රියාකාරිත්වය සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබුණු රුපියල් දශ ලක්ෂ 128 ක හිඟ මුදලය. අලෙවි කළ දුම්කොළ ප්‍රමාණයේ වැඩි වීම සහ බදු අනුපාතිකයේ වැඩිවීම නිසා දුම්කොළ බදු මගින් ලද ආදායම සියයට 28 කින් වැඩි වී ඇත. සුරා බදු වලින් ලද ආදායමේ සියයට 130 ක වැඩි වීම ද සමාන හේතුන් මතම සිදු වී ඇත. කෙසේ වෙතත්, අඩු මිල ගණන් නිසා තේ බද්දෙන් ලද ආදායම රුපියල් දශ ලක්ෂ 65 කින් පහත වැටී ඇත. 1977 නොවැම්බර් මස ඉවත් කෙරුනු විවිහිස ක්‍රමය මගින් ලද හිඟ මුදල රුපියල් දශ ලක්ෂ 329 ක් විය. මෙවා පසුව ගෙවීමේ පදනම යටතේ වූ ආනයන සඳහා කළ ඉදිරි විනිමය මිල දී ගැනුම් සම්බන්ධයෙන් වූ ලැබීම් ය.

## 1·14 වැනි සංඛ්‍යා සටහන

## රාජ්‍ය මුදල් පරිහරණය 1975-1979

රුපියල් දශලක්ෂ

| ශීර්ෂ | 1975 | 1976 | 1977 | 1978 අනුමත ඇස්තමේන්තු | 1978 තාවකාලික | 1979 අනුමත ඇස්තමේන්තු |
|---|---|---|---|---|---|---|
| 1· ආදයම1 .. | 5,084 | 5,739 | 6,686 | 10,830 | 11,633 | 11,429 |
| 2· පුනරාවර්තන වියදම .. | 5,159 | 5,554 | 6,148 | 9,972 [3] | 10,408 | 10,734 |
| 3· අත්තිකාරම් ගිණුම් කටයුතු (—අතිරික්තය/හිඟය + .. | — 73 | — 312 | — 430 | — 100 | —1,926 | + 200 |
| 4· වර්තන ගිණුම (+අතිරික්තය/හිඟය—) .. | — 142 | — 128 | + 108 | + 758 | — 701 | + 895 |
| 5· ප්‍රාග්ධන වියදම .. | 2,556 | 3,448 | 3,182 | 5,181 [3] | 6,606 | 7,195 |
| ඉන් නිදන් අරමුදලට ක්‍රමක්ෂය ගෙවීම් සහ ජාත්‍යන්තර සංවිධාන වලට දයක දීමනා .. | (596) | (662) | (947) | (1,092) | (1,165) [4] | (1,328) |
| 6· අයවැය හිඟය .. | 2,699 | 3,576 | 3,074 | 4,423 | 7,307 | 6,300 |
| 7· හිඟය පියවීම | | | | | | |
| 7·1 දේශීය මූල .. | 1,610 | 2,284 | 1,786 | 1,603 | 2,778 | 1,950 |
| (අ) බැංකු නොවන වෙළෙඳපොල ණය | 1,075 | 1,160 | 1,504 | 1,750 | 2,033 | 1,950 |
| (ආ) වෙළෙඳපොළ නොවන ණය .. | 379 | 485 | 505 | — 147 | 578 | — |
| (ඇ) බැංකු ක්‍රමය2 .. | 156 | 639 | — 224 | — | 167 [5] | — |
| 7·2 විදේශ මුදල් . | 1,059 | 1,326 | 1,779 | 2,820 | 4,471 | 4,350 |
| (අ) ද්‍රව්‍ය ණය . | 380 | 633 | 885 | 1,620 | 2,128 | 2,200 |
| (ආ) යෝජනාක්‍රම ණය | 275 | 327 | 394 | } 1,200 | 1,665 | } 2,150 |
| (ඇ) දීමනා . | 404 | 367 | 500 | | 678 | |
| 7·3 මුදල් ශේෂ ප්‍රයෝජනයට ගැනීම | 31 | — 33 | —492 | — | 58 | — |
| 8· රාජ්‍ය මුදල් කටයුතුවල ප්‍රසාරණාත්මක බලපෑම .. | 184 | 605 | — 715 | — | 173 | — |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව
මහා භාණ්ඩාගාරය.

1· විදේශ දීමනා යටතේ ඇති ප්‍රාග්ධන දීමනා ආදයමෙහි ඇතුළත් කර නැත.

2· ජාත්‍යන්තර මූල්‍ය සංවිධානවලට දයක දීමනා ලෙස, මහ බැංකුවෙන් කෙරුණ විශේෂ අත්තිකාරම් ඇතුළත්ය.


3· කම්ටු අවස්ථා සංශෝධන හේතුවෙන් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් පිළිවෙලින් රුපියල් දශලක්ෂ 1·7 සහ රුපියල් දශලක්ෂ 0·8 ලෙස කරන ලද වෙන්කිරීම් ඇතුළත්ය.

4· රුපියල් දශලක්ෂ 174 ක විදේශ පරිපාලන ණය ආපසු ගෙවීමක්ද ඇතුළත්ය.

5· බැංකු ක්‍රමයට රුපියල් ණයෙහි රුපියල් දශලක්ෂ 52 ක ආපසු ගෙවීම ගැලපුම් කොට නැත.

# රජයේ ආදායම සහ වියදම

මුදල් වර්ෂ අනුව*




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.


මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව
මහා භාණ්ඩාගාරය

* 1970/71 වර්ෂය ඇතුළත්ව එම වර්ෂය දක්වා වූ මුදල් වර්ෂ සැප්තැම්බර් 30 වෙනි දිනයෙන් අවසන් වේ. 1971/72 මුදල් වර්ෂය 1971 ඔක්තෝබර් 01 දින සිට 1972 දෙසැම්බර් 31 දින දක්වා වූ පහළොස් මාසයට අදළ වේ. 1973 සිට මුදල් වර්ෂ දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන වර්ෂයට අදළ වේ.

ජාතික සංවර්ධන සංචිතය වෙතින් මූල්‍ය පහසුකම් සපයන ලද වියදම් සහ අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධ ශුද්ධ ගෙවීම්ද එකතුව (නිදන් අරමුදල් දායකත්වයන්, ආදායම් වෙතින් රාජ්‍ය ණය සම්බන්ධව කළ සෘජු ආපසු ගෙවීම් සහ ජාත්‍යන්තර මූල්‍ය සංවිධානයට කළ විශේෂ ගෙවීම් හැර) වියදම් සම්බන්ධ වූ සංඛ්‍යා, වෙන් කල මුළු වියදමට අදළ වේ. පරිශිෂ්ඨයේ 9 වැනි සංඛ්‍යා සටහන ද බලන්න.

1978 සංඛ්‍යා තාවකාලිකය.

# රාජ්‍ය ණය සංයුතිය




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

ශූඩ: දළ රාජ්‍ය ණය නිදන් අරමුදල් අඩුකළ පසු.
1978 සංඛ්‍යා තාවකාලිකය.

පැකට් කරන ලද තේ සඳහා වූ කිලෝ 1 කට රු. 2.00 ක බදු අඩු කිරීම හා කුට්ටි රබර් සඳහා සියයට 50 සිට 75 දක්වා වූ බදු වැඩි කිරීම හැරුන විට, විමර්ශනයට ලක්ව ඇති වර්ෂයේදී තේ හෝ රබර් අපනයන බදු වල වෙනත් ප්‍රතිශෝධනයක් නොවීය. 1978 අගෝස්තු 1 වැනි ද සිට බල පවත්වන පරිදි, කපාපු පොල් සඳහා මෙට්‍රික් ටොන් 1 කට රු. 6,450 ක් ද, පොල් තෙල් මෙට්‍රික් ටොන් 1 කට රු. 1,650 ක් ද, කොප්පරා මෙට්‍රික් ටොන් 1 කට රු. 5,420 ක් ද බැගින් වූ විශේෂිත බදු පනවන ලදී. අමු පොල් සඳහා වූ බද්ද, ගෙඩි 1000 කට රු. 450 ලෙස නියම කර තිබුනි. මීට අමතරව පොල් මදයෙන් කළ නිෂ්පාදන සඳහා පරිපාලනමය අය කිරීමක් ද කරන ලදී. කරද මුංගු, කොකෝවා, කුරුඳු, කොකෝවා ඇට සහ පැඟිරි තෙල් යන සුළු අපනයන බෝග සඳහා වූ අපනයන බදු වර්ෂය තුළ දී අඩු කරන ලදී. ආනයන බදු අනුපාතික නිරන්තර විමර්ශනයට ලක් වූ අතර, තීරු බදු විමර්ශන කමිටුවේ නිර්දේශ මත, පවතින අනුපාතිකයන් විටින් විට වෙනස් කරන ලදී.

ගැඹුරු දියේ සහ වෙරළාසන්න මසුන් මැරීම, සතුන් ඇති කිරීම, වී කෙටීම හා කුඩා කර්මාන්තයන්හි ආයෝජනයන් සඳහා බදු නිවාඩු ප්‍රදනය කෙරින. නිවාස දේපොල සංක්‍රාමයන්ගෙන් ලැබෙන ලාභ සඳහා බදු නිදහස් කිරීමක් ප්‍රදනය කර ඇති අතර, කර්මාන්තයන්හි ආයෝජන සඳහා, ක්ෂයවීම් වෙනුවෙන් ගැලපුම් ද ප්‍රදනය කර ඇත. පෞද්ගලික ආදයම් බදු සම්බන්ධයෙන් මූලික පවුල් දීමනාව වසරකට රු. 3600 සිට රු. 5000 දක්වා වැඩි කරන ලදී. මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ වන ආයෝජන සංවර්ධන කලාපයන්හි ස්ථාපිත කර්මාන්තවල කරන ආයෝජන සඳහා සැලකිය යුතු නිදහස් කිරීම් ද ප්‍රදනය කර ඇත.

මුළු ආදයමේ වක්‍ර බදු මෙන්ම, විදේශ වෙළඳාම සම්බන්ධ බදුවල සාපේක්ෂ කොටස්වල තියුනු වැඩි වීම 1978 ආදයම් ව්‍යුහයේ කැපී පෙනුනු ලක්ෂණයක් විය. මුළු ආදායමේ ප්‍රතිශතයක් වශයෙන් සැලකීමේ දී වක්‍ර බදු සැලකිය යුතු ප්‍රමාණයකින් එනම් 1977 දී සියයට 67 සිට 1978 දී සියයට 79 දක්වා වැඩි වී ඇත. මෙම වැඩිවීමට ප්‍රධාන වශයෙන් හේතු වූයේ විදේශ වෙළඳාම් බදු එකතුව 1977 දී සියයට 43 සිට 1978 දී සියයට 53 දක්වා වැඩි වීමය. මෙසේ වක්‍ර බදු වෙත නැඹුරු වීම, බදු එකතු කිරීම ආශ්‍රිතව ඇති බාධක ලිහිල් කිරීමක් වුවද, න්‍යායාත්මක දෘෂ්ටි කෝණයකින් බැලීමේදී බදු ක්‍රමයේ ඇති සංවර්ධනාත්මක ස්වභාවය හීන වන බව පෙන්නුම් කරයි. කෙසේ වෙතත් සාධාරණ වක්‍ර බදු සංකලනයකින් සාපේක්ෂ වශයෙන් ප්‍රගතිශීලී වූ බදු ක්‍රමයක් නිර්මාණය කළ හැකි විය යුතුය.

**වියදම**

1978 වසර සඳහා රජයේ මුළු වියදම රුපියල් දශ ලක්ෂ 18,939 කි. පුනරාවර්තන වියදම රුපියල් දශලක්ෂ 10,408 ක් විය. එය සියයට 69 ක වැඩිවීමක් පෙන්නුම් කළ අතර ශුද්ධ ප්‍රාග්ධන වියදම රුපියල් දශ ලක්ෂ 5,441 දක්වා සියයට 143 කින්, ඉහළ ගොස් ඇත. නිදන් අරමුදල් සඳහා දයක දීමනා සහ ණය ගෙවීම් රුපියල් දශ ලක්ෂ 1,165 ක් විය. අත්තිකාරම් ගිණුම් යටතේ ගෙවීම් මීට ඉහත නොතිබුණු අන්දමේ, රුපියල් දශලක්ෂ 1,926 ක ඉහළ මට්ටමක පැවතුණි.

පුනරාවර්තන වියදමේ වැඩිවීම අර්ධ වශයෙන්, විනිමය අනුපාතික අවප්‍රමාණ කිරීම නිසා ඇති වූ මිල හා වියදම ඉහළ යෑමේ ප්‍රතිඵලයකි. පරිභෝජක සහනාධාර, අනෙකුත් සමාජ සේවා හා පොදුසේවා පවත්වාගෙන යාමේදීවූ වියදම් වැඩිවීම සහ රාජ්‍යසේවා දීමනා පරිමාවේවූ වැඩිවීම අනෙක් හේතූන් අතර වේ. ජනගහනයේ අඩකට ආසන්න කොටසකගෙන් ආහාර සහනාධාරය ඉවත් කළද, පුනරාවර්තන වියදමේ ප්‍රධානතම ශීර්ෂය ලෙස ආහාර සහනාධාරය තව දුරටත් පැවතිනි. මෙකී වැඩිවීමට ප්‍රධාන හේතු වශයෙන් වී බුසලකට ගෙවූ සහතික මිල රුපියල් 33 සිට රුපියල් 40 දක්වා වැඩි කිරීම සහ විනිමය අනුපාතිකයේ අගය අඩුවීම හේතුවෙන් ආනයනය කරන ලද පිටි සහ සහල්වලට ගෙවන රුපියල් මිල වැඩිවීම දැක්විය හැක. රාජ්‍ය ණය සඳහා වූ පොළී මුදල රුපියල් දශ ලක්ෂ 1,368 ක් වූ අතර මුදල් අමාත්‍යාංශයේ අනෙක් වර්තන වියදම් වූ, රජයේ සේවක වැටුප්

වැඩි කිරීම සඳහා වෙන් කිරීම, පොහොර සහනාධාරය, රාජ්‍ය සංස්ථාවල උද්ගත වන පාඩු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවට දෙන පොලී සහනාධාරය රුපියල් දශ ලක්ෂ 1,683 ක් විය. අධ්‍යාපන ක්ෂෙත්‍රයේ පුනරාවර්තන වියදම රුපියල් දශලක්ෂ 1,040 ක් වූ අතර විශ්‍රාමික රජයේ සේවකයන්ට ගෙවන ලද විශ්‍රාම වැටුප් ද ඇතුළත්ව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ වියදම රුපියල් දශලක්ෂ 676 ක් විය. කෘෂිකර්ම අමාත්‍යාංශයේ වියදම රුපියල් දශ ලක්ෂ 510 ක් ද, සෞඛ්‍ය අමාත්‍යාංශයේ වියදම රුපියල් දශ ලක්ෂ 523 ක් ද, ගමනා ගමන වෙනුවෙන් රුපියල් දශ ලක්ෂ 508 ක් සහ ආරක්ෂක කටයුතු වෙනුවෙන් රුපියල් දශලක්ෂ 430 ක් ද විය.

අත්ත්කාරම ගිණුම් වලින් ශුද්ධ ගෙවීම රුපියල් දශ ලක්ෂ 1,926 ක් විය. මෙහි ප්‍රධාන වැඩිවීම වූයේ ආහාර දෙපාර්තමේන්තුවේ මිලට ගැනීම් කටයුතුවලට ලබා දුන් රුපියල් දශලක්ෂ 1,050 ක අත්තිකාරමයි. අනෙකුත් අංශ අතර වී අලෙවි මණ්ඩලයට දෙන ලද රුපියල් දශලක්ෂ 200 ද, ශ්‍රී ලංකා—චීන වෙළඳ ගිණුමෙහි කටයුතු උදෙසා වෙළඳ ද්‍රව්‍ය මිලට ගැනීමෙ කොමසාරිස් හට දෙන ලද රුපියල් දශලක්ෂ 200 සහ ගබඩා සහ උපකරණ මිලයට ගැනීම සඳහා වූ රුපියල් දශලක්ෂ 117 ක වැඩි වීමක් ද ඇතුළත් වෙ.

## ප්‍රාග්ධන වියදම්


1978 වසර සඳහා ශුද්ධ ප්‍රාග්ධන වියදම රුපියල් දශලක්ෂ 5,441 විය. එය පසුගිය වසරට වඩා සියයට 143 ක වැඩිවීමකි. නිදන් අරමුදල් දායක දීමනා හා ණය ආපසු ගෙවීම් වෙනුවෙන් වූ රුපියල් දශ ලක්ෂ 1,165 ක් මීට ඇතුළත් නොවේ. ප්‍රාග්ධන වියදම් වැඩිවීම් වලින් කොටසක් විනිමය අනුපාතික වෙනස්වීම් නිසා උද්ගත වූ පිරිවැය ඉහළයෑම් පියවා ගැනීමට වූ අතර සැළකිය යුතු පරිමාවක් නව සංවර්ධන කාර්යයන් වෙනුවෙන් යෙදවුණු බැව් පෙනී යයි. තවද, තාවකාලික දත්ත පිරික්සීමේදී පෙනී යන කරුණක් නම් වෙන් කරන ලද අරමුදල්වල ඌණ ලෙස ප්‍රයෝජනයට ගැනීම 1977 සියයට 27 සිට 1978 සියයට 16 දක්වා පහත වැටීමයි. කෙසේ වුවද, සමහර අයවැය වෙන් කිරීම්, පසුව ප්‍රයෝජනයට ගැනීමේ අභිලාෂයෙන් භාණ්ඩාගාර තැන්පතුවලට හා මහ බැංකුවේ භාරකාරත්වය යටතට පත්කිරීම නිසාත් ඌණ වියදම් මට්ටම පහළ වැටීමට අර්ධ වශයෙන් හේතුවිය. එසේ භාණ්ඩාගාර තැන්පත් වලට මාරු කල මුදල දළ වශයෙන් රුපියල් දශ ලක්ෂ 280 කි. රජයේ නිවාස ඉදි කිරීමේ වැඩ පිළිවෙල සඳහා 1979 වර්ෂයේදී වැය කිරීමට බලාපොරොත්තු වන රුපියල් දශලක්ෂ 50 ක්ද මෙහි ඇතුලත්ය. ජාතික සංවර්ධන බැංකුවේ මූල ධනය සඳහා වූ රුපියල් දශලක්ෂ 390 ක වෙන් කිරීමක් ද, රජය විසින් මහ බැංකුවේ භාරකාරත්වය යටතට මාරු කර ඇත. මෙම මාරු කිරීම සඳහා ගැලපුම් කල පසුව ඌන උපයෝජන මට්ටම සියයට 27 ක් බැව් පෙනේ.

මුළු ප්‍රාග්ධන වියදම් වලින් සියයට 31 කට ආසන්න ප්‍රමාණයක් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වැය කොට ඇති අතර, කර්මාන්ත හා විද්‍යා කටයුතු අමාත්‍යාංශය සියයට 18 කට හිමිකම් කීය. කෘෂිකාර්මික සංවර්ධනයේ නියුතු අමාත්‍යාංශ එනම්, ඉඩම් හා ඉඩම් සංවර්ධන, මහවැලි සංවර්ධන සහ කෘෂිකාර්මික සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශ හිමිකම කී ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 831 ක් හෙවත් මුළු ප්‍රාග්ධන වියදමෙන් සියයට 15 කි. රුපියල් දශ ලක්ෂ 752 ක මුදලක් හෙවත් සියයට 14 ක්, පොදු කාර්‍ය සංවර්ධන කටයුතුවල නියුතු අමාත්‍යාංශ එනම්, විදුලිබල හා මහා මාර්ග, ප්‍රවාහන සහ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යාංශ මගින් වැය කර තිබුනි. කර්මාන්ත හා විද්‍යා කටයුතු සහ කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශවල මුදල් උපයෝජනය ඉහළ මට්ටමක පැවතුන අතර, මුළු ප්‍රාග්ධන වියදමේ සාමාන්‍යය සමග සැසඳීමේදී අධික ඌණ උපයෝජන වාර්තා කළ අමාත්‍යාංශ වූයේ ඉඩම් හා ඉඩම් සංවර්ධන (සියයට 52), ධීවර (සියයට 45), විදුලිබල හා මහා මාර්ග (සියයට 29) සහ සැලසුම් ක්‍රියාත්මක කිරීම (සියයට 28) යන අමාත්‍යාංශ යන්ය.

## අයවැය හිඟය පියවීම

1978 දී අයවැය හිඟය රුපියල් දශ ලක්ෂ 7,307 ක් වූ අතර, ඉකුත් වසරේ මෙම හිඟය රුපියල් දශ ලක්ෂ 3,074 ක් බව පෙනී යයි. රජය දේශීය වශයෙන් රුපියල් දශ ලක්ෂ 2,836 ක ණය ලබාගත් අතර, විදේශීය මූලයන්ගෙන් ණය හා ආධාර වශයෙන් රුපියල් දශලක්ෂ 4,471 ක්.ලබාගෙන ඇත.

# දේශීය ණය සංයුතිය.





ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

* දළ රාජ්‍ය ණය නිදහස් අරමුදල් අඩුකළ පසු
1978 සංඛ්‍යා තාවකාලිකය.

## විදේශීය ණය සංයුතිය




ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව. මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

† යෝජනා ක්‍රම නොවන (ද්‍රව්‍ය) ණය – ජා. මූ. අ. භාරකාර අරමුදල් ණයද ඇතුළත් වේ.
1978 සංඛ්‍යා තාවකාලිකය.

වෙළඳ පොල මූලයන්ගෙන් ලද රුපියල් දශ ලක්‍ෂ 2,200 ක් හා වෙළඳ පොල නොවන මූලයන්ගෙන් ලද රුපියල් දශ ලක්‍ෂ 578 ක් දේශිය ණයෙහි ඇතුලත් විය. රුපියල් ණය මගින් ලද රුපියල් දශ ලක්‍ෂ 1,750 කින්, භාණ්ඩාගාර බිල්පත් මගින් ලද රුපියල් දශ ලක්‍ෂ 124 කින් හා මහ බැංකු අත්තිකාරම් මගින් ලද රුපියල් දශ ලක්‍ෂ 338 කින් දේශීය ණය සමන්විත වූ අතර, බදු සංචිත සහතිකපත් දූරීම් රුපියල් දශ ලක්‍ෂ 12 කින් අඩු විය. රුපියල් ණය සඳහා දයක වීම් බැංකු නොවන අංශයටම සීමා විය. කෙසේ වෙතත්, බැංකු අංශය දූරූ රුපියල් ණය රුපියල් දශ ලක්‍ෂ 52 ක් රජය විසින් ආපසු ගෙවන ලදී. භාණ්ඩාගාර බිල්පත් සලකා බැලීමේ දී බැංකු නොවන අංශයේ දූරීම් රුපියල් දශ ලක්‍ෂ 295 කින් වැඩිවීමත්, බැංකු අංශයේ දූරීම් රුපියල් දශ ලක්‍ෂ 171 කින් අඩුවීමත් නිසා මුළු වැඩිවීම රුපියල් දශ ලක්‍ෂ 124 ක් බව පිළිබිඹු වෙයි. වසර සඳහා වූ මහ බැංකු අත්තිකාරම් (ශුද්ධ) ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 338 ක් විය. පිළිවෙලින් භාණ්ඩාගාර බිල්පත් හා රුපියල් ණය සඳහා වූ රුපියල් දශ ලක්‍ෂ 171 හා රුපියල් දශ ලක්‍ෂ 52 සඳහා ගැලපුම් කල පසුව, සමස්ත වශයෙන් බැංකු ක්‍රමය වෙතින් ලබාගත් ශුද්ධ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 116 ක් විය.

වෙළඳ පොල නොවන ණය ගැනීම් අතර රුපියල් දශ ලක්‍ෂ 628 ක් වූ භාණ්ඩාගාර තැන්පතු ප්‍රධාන මූලය වූ අතර, රුපියල් දශ ලක්‍ෂ 224 ක ශුද්ධ පරිපාලන ණය ආපසු ගෙවීමක් විය. එයට අමතරව භාණ්ඩාගාරයේ මුදල් ශේෂ හීන කරමින් රුපියල් දශ ලක්‍ෂ 58 ක් ද ලබා ගන්නා ලදී.

අයවැය හිඟය පියවා ගැනීමට විදේශ මූලයන්ගෙන් ප්‍රයෝජනයට ගත් ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 4,471 ක් විය. රුපියල් දශ ලක්ෂ 1,665 ක යෝජනා ක්‍රම ණය සහ රුපියල් දශ ලක්‍ෂ 2,128 යෝජනා ක්‍රම නොවන ණය මෙහි ඇතුළත් වූ අතර දීමනා වශයෙන් ලද රුපියල් දශ ලක්‍ෂ 678 ක් ද වෙයි.

UNIVERSITY OF MORATUWA LIBRARY SRI LANKA

රාජ්‍ය ණය

1978 දී නොපිය වූ රාජ්‍ය ණය ප්‍රමාණය සියයට 24 කින් වැඩි විය. එහෙත් පසුගිය වසරේ වැඩිවීම සියයට 42 කි. පෙර වසරේ වූ අධික වැඩිවීම, ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතිකය ඒකීයකරනයත් සමඟ විදේශීය ණය වගකීමේ වූ සැළකිය යුතු වෙනස නිසා මතු වූවකි. දළ රාජ්‍ය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 30,950 ක් විය. මෙයින් රුපියල් දශ ලක්‍ෂ 16,368 ක් දේශීය ණය වූ අතර, විදේශීය ණය ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 14,582 ක් විය.

1978 තුලදී දළ දේශීය ණය රුපියල් දශ ලක්‍ෂ 1975 කින් රුපියල් දශ ලක්‍ෂ 16,368 දක්වා ඉහළ ගියේය. වර්ෂය තුලදී කරන ලද ආපසු ගෙවුම් සඳහා ගැලපුම් කිරීමෙන් පසු, ප්‍රධාන දේශීය ණය වර්ගය වූ මැදි සහ දිගුකාලීන රුපියල් ණය ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 1,657 කින් වැඩි වී ඇත. පෙර වසරේ වූ මෙකී ණය ප්‍රමාණය රුපියල් දශ ලක්‍ෂ 1,390 කි. පසුගිය වසරේ දී භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් කළ රුපියල් දශ ලක්‍ෂ 200 ක ශුද්ධ ආපසු ගෙවීම සැලකීමේ දී මේ වසරේ අයවැය පියවීම සඳහා භාණ්ඩාගාර බිල්පත් මගින් රුපියල් දශ ලක්‍ෂ 135 ක් ලබාගත් බව පෙනී යයි. මේ හේතුකොට ගෙන වසර අවසානයට නොපිය වූ බිල්පත් වල වටිනාකම රුපියල් දශ ලක්‍ෂ 2,635 දක්වා ඉහල ගියේය. මහ බැංකු අත්තිකාරම්, රුපියල් දශ ලක්‍ෂ 338 කින් ඉහල ගිය අතර බදු සංචිත සහතිකපත් රුපියල් දශ ලක්‍ෂ 11 කින් පහත වැටිනි.

1977 අංක 25 දරන විසර්ජන නීතිය ප්‍රකාර අවුරුදු 10 සිට 12 දක්වා කාලයකින් කල් පිරෙන, රුපියල් දශ ලක්‍ෂ 1,750 ක, රුපියල් ණය ප්‍රමාණයක් නිකුත් කරන ලදී. මෙම සුරැකුම් පත්වලට වසරකට සියයට 10 ක පොලියක් හිමිවේ. මෙම ණය වැඩසටහනේ දයකත්වයන් නොවැම්බර් මාසයේදී සම්පූර්ණ වීම නිසා වසරේ අවසාන දෙමාසය තුලදී අළුත් ණය නිකුත් කරනු නොලැබිනි. රාජ්‍ය ණයෙහි සම්ප්‍රදයිකව ආයෝජනය කරන්නන් හට භාණ්ඩාගාර බිල්පත්වල ද ආයෝජනය කිරීමට අවස්ථාවක් සලසා දෙන ලදී. වසර තුලදී ණය වැඩසටහනට ප්‍රධාන වශයෙන් දයක වූයේ නිදන් අරමුදල්, අර්ථසාධක අරමුදල, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ රක්‍ෂණ සංස්ථාවය. සේවක අර්ථ සාධක අරමුදල, එම

අරමුදලට ලැබුණු දයක මුදල් වැඩිවීමේ හේතුවෙන් දයකත්වයේ සාපේක්ෂ කොටස 1977 දී සියයට 27 සිට 1978 දී සියයට 33 දක්වා වැඩිකර ගන්නා ලදී. අනෙක් අතට ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ කොටස 1977 දී සියයට 27 සිට 1978 දී සියයට 22 දක්වා පහත වැටුනි. කල්පිරෙන කෙටි කාලීන ස්ථිර තැන්පතු මුදා හැරීමට හැකි වනු වස් අඩු කල්පිරීමක් ඇති ආයෝජනයන්හි මුදල් යෙදීමෙහි බැංකුවේ ඇති අවශ්‍යතාවය මෙයට තරමක් දුරට හේතු විය.

1978 දී විදේශීය ණය මගින් වූ දළ ලැබීම රුපියල් දශ ලක්ෂ 3,716 කි. ආපසු ගෙවීම ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 501 ක් විය. විනිමය අනුපාතිකයන්ගේ උච්චාවචනයන් දරා ගැනීම සඳහා වූ රුපියල් දශ ලක්ෂ 773 ක වගකීමක් සමඟ ශුද්ධ සම්පත් පැවැරුම රුපියල් දශ ලක්ෂ 3,215 ක් විය. මේ අනුව නොපියවූ විදේශ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 3,988 කින් ඉහළ යෑම නිසා, මෙම වර්ෂය දේශීය ණයෙහි වැඩිවන වේගය, විදේශීය ණය වැඩිවන වේගය අඛණ්ඩව ඉක්ම වූ සතර වැනි වර්ෂය බවට පත් විය. 1975 වර්ෂ අවසා-නයේ දී මුළු ණය ප්‍රමාණයෙන් සියයට 25 ක් වූ විදේශ ණය ක්‍රමයෙන් 1976 දී සියයට 28 දක්වා ද, 1977 දී සියයට 42 දක්වා ද, 1978 දී සියයට 47 දක්වා ද වැඩිවුනි. මෙයින් හෙළි දරව වන්නේ රටේ ආර්ථික සංවර්ධන වැඩපිළිවෙලට මුදල් සම්පාදනය කිරීම සඳහා දිගුකාලීන විදේශ සම්පත් මත වැඩි විශ්වාසයක් තබා ඇතිබවයි. 1978 ප්‍රාග්ධන වියදමින් සියයට 60 මූල්‍යකරණය කර ඇත්තේ මේ අයුරින් ලබාගත් විදේශ ණය මගිනි. අනාගතයේ දී අපනයන ඉපැයුම් ප්‍රමාණය පැහැදිලි අයුරකින් වැඩිකර ගැනීමට නොහැකි වන්නේ නම් සංවර්ධන වැය මූල්‍යකරණය සඳහා විදේශ සම්පත් මත වැඩි විශ්වාසයක් තැබීමෙන්, අනාගතයේදීද ආර්ථිකය වෙත හා අයවැය මත පැටවෙන ණය සේවා කිරීම් උග්‍ර කරයි. ණය වගකීමෙහි සැළකිය යුතු වැඩිවීමක් සහ අපනයනයන්ගේ ප්‍රමාණවත් නොවන වර්ධනයක් තිබියදීත් 1975 දී 23 ක් වූ ණය සේවා කරන අනුපාතය 1978 දී සියයට 13 දක්වා පහත වැටුනි ණය ව්‍යුහයේ මෙවැනි දියුවීමකට වැඩි වශයෙන්ම හේතු වූයේ මෑතදී ගිවිසගත් ණය සියල්ලක්ම පාහේ, අවුරුදු 5 ත් 10 ත් අතර වන තරමේ අනුග්‍රහ (ආපසු ගෙවීමක් නැති) කාලසීමාවක් තිබීම හා ආපසු ගෙවීම් කාලය ඉතා දීර්ඝවීමයි. මෑතක සිට කෙටි කාලීන ණය කෙරෙහි තැබූ විශ්වාසය අඩුවීම ද ඊට හේතුවකි. ඒ නිසා, පසුගිය කාලය තුල ලබාගත් ණයවල අනුග්‍රහ කාල සීමාවන් නිමවීමත් සමඟ මෑත අනාගතයේදී ණය සේවාකරණයේ බර ක්‍රමයෙන් වැඩිවන තත්ත්වයක් ඇතිවනු ඇත.

විදේශයන්ගෙන් ලබාගත් දළ ණය ප්‍රමාණය, රුපියල් දශ ලක්ෂ 1,584 ක යෝජනා ක්‍රම ණය සහ රුපියල් දශ ලක්ෂ 1,343 යෝජනා ක්‍රම නොවන (ද්‍රව්‍ය) ණය වලින් ද සමන්විත විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ භාරකාර අරමුදලින් ලබාගත් රුපියල් දශලක්ෂ 789 ක ණය මුදලක් ද මීට ඇතුළත් වේ.

නෙදර්ලන්තයෙන් රුපියල් දශ ලක්ෂ 348 ක්, ජර්මන් ෆෙඩරල් ජනරජයෙන් රුපියල් දශලක්ෂ 329 ක්, ඉන්දියාවෙන් රුපියල් දශලක්ෂ 96 ක්, කුවායිට් රාජ්‍යයෙන් රුපියල් දශලක්ෂ 61 ක්, චීනයෙන් රුපියල් දශලක්ෂ 47 ක්, සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයෙන් රුපියල් දශලක්ෂ 31 ක්, ඩෙන්මාර්කයෙන් රුපියල් දශලක්ෂ 12 ක්, කැනඩාවෙන් සහ ඇමරිකා එක්සත් ජනපදයෙන් රුපියල් දශ ලක්ෂ 5 බැගින් සහ එක්සත් රාජධානියෙන් ලත් රුපියල් දශ ලක්ෂ 1 ක්, 1978 යෝජනා ක්‍රම ණය සමූහයට ඇතුළත්වේ. මේ කාලය තුළදීම ආසියානු සංවර්ධන බැංකුවෙන් රුපියල් දශලක්ෂ 439 ක්, ජාත්‍යන්තර සංවර්ධන සංගමයෙන් රුපියල් දශ ලක්ෂ 167 ක්, ජාත්‍යන්තර ප්‍රතිසංස්කරණ හා සංවර්ධන බැංකුවෙන් රුපියල් දශ ලක්ෂ 26 ක් සහ "ඔපෙක්" සංවිධානයෙන් රුපියල් දශලක්ෂ 16 ක් ද ලැබිනි. මේ වසර තුළ ලැබුනු යෝජනා ක්‍රම නොවන ණය අතර ඇමරිකා එක්සත් ජනපදයෙන් (රුපියල් දශ ලක්ෂ 582), ජපානයෙන් (රුපියල් දශලක්ෂ 462) කැනඩාවෙන් (රුපියල් දශලක්ෂ 141), ඉන්දියාවෙන් (රුපියල් දශලක්ෂ 79), ජර්මන් ෆෙඩරල් ජනරජයෙන් (රුපියල් දශලක්ෂ 46), ප්‍රංශයෙන් (රුපියල් දශලක්ෂ 30), සෝවියට් සමාජවාදී සමූහාණ්ඩු සංගමයෙන් සහ හංගේරියාවෙන් (රුපියල් දශලක්ෂ 1 බැගින්) ලැබුන ණය සඳහන් කළ හැක.

දේශීය ණය සේවා අනුපාතය (ණය සේවා ගෙවීම් රජයේ ආදායමේ ප්‍රතිශතයක් හැටියට) වසර තුළ පහත වැටිනි. 1977 දී 18 ක් වූ මෙම අනුපාතය 1978 දී 14 දක්වා අඩුවීමට අර්ධ වශයෙන් හේතු වූයේ 1977 වසරේ මූල්‍ය ප්‍රතිසංස්කරණ නිසා පසුගිය වසරට වඩා වැඩි පරිමානයකින් ආදායම එකතු වීමය. ඒ අතර දේශීය ණය වැඩි වූ ප්‍රතිශතය 14 ක් පමණක් විය.